**මහරගම නගර සභාව - 2023**

---------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මහරගම නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහරගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.26 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ රු.196,623,414 ක් විය යුතු වුවත් රු.212,384,111 ක් ලෙස දක්වා තිබුණි. | අදාල මුදල් ගලායාම හා ගලාඒම් ගැලපීම් මඟින් රු.212,384,111 ක් ලෙස මුදල් ශේෂය ලැබුණු බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.29 අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයෝජන සඳහා යෙද වූ මුදල රු.150,000,000 ක් විය යුතු වුවද රු.106,788,871 ක් ලෙස ගැලපීම හේතුවෙන් රු.43,211,129 කින් ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | රු.106,788,871 ක අගය නිවැරදි බව. | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ අවසන් කළ ව්‍යාපෘති 03 ක කළ වැඩ වටිනාකම රු.6,006,569 ක් වුව ද ඇස්තමේන්තු වටිනාකම වූ රු.11,700,000 ක් ගිණුම්ගත කර තිබුණු හෙයින් ණයහිමි ගිණුම් හා වියදම් ගිණුම් රු.5,693,431 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම කර්මාන්ත තුන සඳහාම කොටස් ගෙවීමක් පමණක් සිදු කිරීම නිසා තවදුරටත් ගෙවීම් සිදු කිරීමට තිබූ රු.5,693,431ක් ණය හිමියන් ලෙස ගිණුම්ගත කර ඇති බව. | ගෙවා නිම වූ ව්‍යාපෘති සඳහා ණය හිමි වෙන් කිරීම නොකළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති දෙකක නොනිමි ගිණුම්ගත කිරීමේදී දෙවරක් සටහන් කිරීම නිසා නොනිමි ගිණුම හා සංචිත හා වෙන් කිරීම් ගිණුම රු.9,900,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණ ආදායම රු.720,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කර ඇති බව. | -එම- |

### 1.6.3 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාතර්ා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේ දී රු.17,201,027 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සේවක ඇප තැන්පත් ගිණුම අනුව ශේෂය රු.769,379 ක් වූ අතර සේවක ඇප ආයෝජන ගිණුම අනුව රු.880,592 ක් වූයෙන් රු.111,213 ක වෙනසක් විය. | ඇප තැන්පත් මුදලක් ලද විගසම ආයෝජනය නොකිරීම හා සේවක ඇප ආයෝජන ගිණුමට තැන්පත්කරුවන්ගේ පොලී ආදායම ඇතුළත් වන අතර සේවක ඇප තැන්පතු ගිණුමට පොලී ඇතුළත් නොකිරීම වැනි හේතූන් මත සේවක ඇප තැන්පත් ගිණුම හා සේවක ඇප ආයෝජන ගිණුමේ පවතින ශේෂය සමාන නොවන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ලෙජරය අනුව වරිපනම් බදු ආරම්භක ශේෂය රු.222,220,947 ක් වූ අතර උපලේඛනය අනුව රු.222,077,068 ක් වූයෙන් රු.143,879 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2024 වර්ෂයේ මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | පෙර ගෙවුම් හා අත්තිකාරම් | 1,343,706 | උපලේඛන | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගෙවල් කුලී තැන්පත් | 1,084,544 | -එම- | -එම- | -එම- |
| (ඇ) | පළාත් සභාවෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර | 11,471,982 | -එම- | -එම- | -එම- |

### 1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571 | එකතු වටිනාකම රු.37,439,657 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු 208 ක් නියාදනය කර නොතිබුණි. | මෙම කල් ඉකුත් වූ තැන්පත් 2024 අවසාන ගිණුම් සැකසීමේදී ජර්නල් සටහනක් මඟින් ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.480,318,446 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.81,921,825 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023<br>ඇස්තමේන්තු ගත ආදායම<br>(රු) | බිල්කළ ආදායම<br>(රු) | රැස්කළ ආදායම<br>(රු) | දෙසැම්බර් 31දිනට මුළු හිඟය<br>(රු) | 2022<br>ඇස්තමේන්තු ගත ආදායම<br>(රු) | බිල්කළ ආදායම්<br>(රු) | රැස්කළ ආදායම<br>(රු) | දෙසැම්බර් 31දිනට මුළු හිඟය<br>(රු) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 000' | 000' | 000' | 000' | 000' | 000' | 000' | 000' |
| i | වරිපනම් හා බදු | 252,433 | 265,592 | 166,139 | 99,453 | 244,688 | 250,620 | 238,377 | 222,220 |
| ii | කුලී | 25,260 | 27,461 | 21,913 | 5,549 | 24,545 | 24,879 | 25,168 | 11,928 |
| iii | බලපත්‍ර ගාස්තු | 1,600 | 6,830 | 6,830 | - | 600 | 473 | 473 | - |
| iv | වෙනත් ආදායම් | 6,000 | 7,141 | 7,141 | - | 9200 | 8,735 | 8,755 | - |
| | එකතුව | 285,293 | 307,024 | 202,023 | 105,002 | 279,033 | 284,707 | 272,773 | 234,148 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | ඉකුත් වර්ෂය අවසානයට පැවති රු.222,214,780 ක් වූ හිඟ වරිපනම් ණයගැති ශේෂයෙන් 2023 දෙසැම්බර් 31 දිනට වරිපනම් සම්බන්ධ ප්‍රගති වාර්තා අනුව රු.74,598,922 ක් පමණක් අය කර ගෙන තිබූ අතර රු.147,478,148 ක් හෙවත් සියයට 66 ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ අයකර ගැනීම සඳහා දේපළ තහනම් කිරීමේ නිලධාරීන්ව ක්ෂේත්‍ර රාජකාරිවල යෙදවීම හා ජංගම සේවා පවත්වා අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | පනතේ විධි විධාන අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | හිඟ වරිපනම් බදු කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 05 සහ ඊට වැඩි කාලයක සිට පැවත එන රු.97,391,793 ක හිඟයක් පැවතිණි. | හිඟ අයකර ගැනීම සඳහා දේපළ තහනම් කිරීමේ නිලධාරීන්ව ක්ෂේත්‍ර රාජකාරිවල යෙදවීම හා ජංගම සේවා පවත්වා අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | පනතේ විධි විධාන අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට රු.100,000 ට වැඩි දේපළ 77 කින් රු.19,996,004 ක් ද රු.50,000 ත් | එහි ප්‍රගතිය ආදායම් පරීක්ෂකවරුන්ගෙන් ලැබුණු පසු ඉදිරිපත් කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| | රු.100,000 ක් අතර දේපළ 133 කින් රු.9,009,215 ක් ද රු.50,000 ට අඩු දේපළ 55495 කින් රු.207,764,789 ක් ද හිඟ හිටිව පැවතුණි. | | |
| (ආ) | කුලී | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කඩ කාමර 318 කින් රු.15,684,183 ක හිඟයක් පැවතුණි. එම ශේෂයේ වර්ෂ 02ක සිට වර්ෂ 03ක් අතර හිඟ පවතින කඩ කාමර 37 කින් රු.2,759,013 ක් ද වර්ෂ 03 ක සිට වර්ෂ 05ක් අතර හිඟ පවතින කඩ කාමර 51 කින් රු.7,232,760 ක් ද වර්ෂ 05 ට වැඩි හිඟ පවතින කඩ කාමර 06 කින් රු.971,734 ක් ද විය. කඩ කුලී නොගෙවන වෙළඳසැල්වල අයිතිය ගිවිසුම් ප්‍රකාරව නැවත නගර සභාව වෙත ලබා ගෙන වෙනත් පාර්ශවයන්ට බදු දීමට කටයුතු නොකිරීම හේතුවෙන් දීර්ඝ කාලයක සිට හිඟයන් ඉදිරියට එමින් පැවතීමට හේතු වී තිබුණි. | පොදු වෙළඳසැල, දෙහිවල පාර, සතිපොළ ප්‍රවේශ මාර්ගය සහ කොට්ටාව ආදී සෙසු වෙළඳසැල් වලට අදාල හිඟය සඳහා අවසාන නිවේදන යවා ඇත. එමෙන්ම මේ වන විට දීර්ඝ කාලයක් හිඟ පවතින කඩ 69 ක් නීති කටයුතු වලට යවා ඇති අතර ඒවා බොහෝමයක් මේ වන විට විභාග වෙමින් පවතින බව. | හිඟ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගිවිසුම් කාලය අවසන් වී තිබුණු වෙළඳ ස්ථාන 210 ක් සමඟ ගිවිසුම් අලුත් කර ගැනීමට හෝ එම වෙළඳ ස්ථාන සභාව වෙත ලබාගෙන වෙනත් පාර්ශවයන්ට බදු දීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් අළුත් කර ගැනීමට හෝ වෙනත් පාර්ශවයන්ට බදු දීමට කටයුතු කළ යුතුය. |
| (iii) | කොළඹ පාර වරිපනම් අංක 98 දරන රථ ගාල බදු කුලී නොගෙවීම මත සභාවට පවරා ගෙන තිබුණද බදු කරුගෙන් අයවිය යුතු 2023 ජුනි මස බදු කුලිය හා දඩ මුදල වූ රු.237,050 ක මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට දිසා අධිකරණයේ නඩු පැවරීමට කටයුතු සූදානම් කරමින් පවතින බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් ඉඳුල් කසළ විකිණීම සඳහා හෝ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් මඟින් පොහොර නිෂ්පාදනය කිරීමට හා නොදිරන කසළ විකිණීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණු හෙයින් සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට රු.69,717,610 ක් ද කෙරවලපිටිය තාප බලාගාරයට කසළ ප්‍රවාහනය සඳහා සභාව තුළ පවතින වාහනවලට අමතරව පෞද්ගලික වාහන සඳහා රු.43,667,950 ක් ද වශයෙන් එකතුව රු.113,385,560 ක් වැයකර තිබුණි. | මහරගම බල ප්‍රදේශයේ ජනනය වන කසළ ප්‍රමාණය වැඩි අතර ඉවත් කරන ලද කසළ කරදියාන කසළ අංගනයට බැහැර කිරීමට හා කුලී පදනම මත කසළ ප්‍රවාහනයට ලබා ගන්නා වාහන සඳහා මුදල් වැය කිරීමට සිදුවේ. මහරගම නගර සභාව සතු කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට හෝ සත්ත්ව ආහාර පිණිස එකතු කර විකිණීම සඳහා ස්ථානයක් නොමැති වීම හේතුවෙන් කසළ නේවාසික හා ව්‍යාපාරික ස්ථානවලින් වෙන් වෙන් වශයෙන් එකතු කර කරදියාන මිහිසරු කොම්පෝස්ට් අංගනය වෙත ලබා දීම සිදු කරන බව. | කසළ විකිණීම තුලින් සභාවට ආදායමක් ලබා ගැනීමට හා කසළ ප්‍රවාහනය සඳහා හැකිතාක් දුරට සභාවේ වාහන යොදවා ගැනීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාරික ආයතනවල කසළ ඉවත් කිරීමෙන් රු.11,698,788 ක ආදායමක් ලබා ගෙන තිබුණද සභාව විසින් කසළ බදු අය කර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගෙන නොතිබුණු අතර සභා තීරණයක් මත ගාස්තු අය කර තිබුණි. | නගර සභා ධුරධාරීන් හා පළාත් සභාව සක්‍රීය තත්ත්වයට පත් වීමෙන් පසු ආයතනවල කසළ ඉවත් කිරීමෙන් ආදායම් එකතු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් සම්මත කිරීමට කටයුතු කරනු ලබන බව. | කසළ බදු අය කිරීමට අතුරු ව්‍යවස්ථාවක් පනවා ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 අගෝස්තු මාසයේදී වසා තිබුණු ජංගම ගිණුමක රු.2,052,258 ක නාමික වටිනාකමක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණ ද එය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් විමර්ශන නිලධාරීන් තිදෙනෙකු ගෙන් යුතු මණ්ඩලයක් පත් කර ඇති අතර එම පරීක්ෂණ වාර්තා ලද පසුව ඉදිරි කටයුතු සිදු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති අංක 4/2018 දරන වත්කම් කළමනාකරණය චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද නගර සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ද වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | එය 2020 වර්ෂයේ දී නව ගිණුම් ක්‍රමය හඳුන්වා දීමත් සමඟ සිදු කළ යුතු වූවක් බැවින් වර්තමානයේ දී ප්‍රත්‍යාගණනය සිදු කර අදාළ ගැලපීම් සිදු කළ නොහැකි බව. | ප්‍රත්‍යාගණනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ රු.194,580,046 ක් අත රඳවා ගෙන තිබුණු අතර එදිනෙදා අවශ්‍යතා සඳහා මුදල් තබාගෙන ඉතිරි මුදල් කෙටි කාලීන තැන්පතුවල ආයෝජනය නොකිරීම නිසා සභාවට ලබා ගත හැකිව තිබූ ආදායමක් අහිමි වී ගොස් තිබුණි. | මුදල් පොතේ පැවති ශේෂයට අනුව මේ වන විට රු.මිලියන 200 ක මුදලක් ස්ථාවර තැන්පතු සඳහා යොමු කර ඇති බව. | වැඩිපුර ඇති මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළ යුතුය. |
| (ඈ) | රජයෙන් දරනු ලබන දේපළ ණය පොලී වාරික මුදල් සභාව වෙත නැවත ප්‍රතිපූර්ණය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම ගිණුමේ ශේෂය රු.5,445,782 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර එම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ 2019.09.19 දිනැති ලිපියට අනුව 2019 හා 2020 වර්ෂ සඳහා දේපළ ණය ප්‍රතිපූර්ණය නොකරන බව දන්වා ඇති අතර ඉන්පසු වර්ෂ සඳහා මේ සම්බන්ධයෙන් ලිඛිත දැනුම් දීමක් සිදු කර නොමැති බව. | දේපළ ණය පොලී ප්‍රතිපූර්ණය කර ගත යුතුය. |
| **(ඉ)** | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වසර 01 ක සිට වසර 07 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන රු.187,327,499 ක් වටිනා කර්මාන්ත ණය හිමියන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2016, 2017, 2018, 2019 හා 2020 වර්ෂයන්හි පැහැදිලිව හඳුනාගත් ණයහිමියන් නිරවුල් කිරීමට කටයුතු කළ අතර ගැටළු සහිත ණයහිමි ශේෂ ඉදිරියේදී නිරවුල් කිරීමට සටහන් කර ගෙන ඇති බව. | කර්මාන්ත ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඊ)** | 2019, 2020, 2021 හා 2022 වර්ෂවලට අදාළ රු.25,424,406 ක් වටිනා පොදු සැපයුම් ණයහිමියන් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරන බව. | සැපයුම් ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | දිර්ඝ කාලයක සිට පැවත එන උසාවි තැන්පතු, ඇප තැන්පතු හා ජාතිය ගොඩනැගීමේ බදු ගිණුම්වල එකතු ශේෂය වූ රු.5,193,559 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නිරවුල් **කිරීමට** කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ඉඩම් 87 ක් අතරින් ඉඩම් 38 ක පමණක් වටිනාකම් හඳුනාගෙන 2023 දී ගිණුම්ගත කර තිබුණි. | ඔප්පු පිළිබඳ විස්තර සහිත ලේඛනයේ ඉඩම් 78 ක් පිළිබඳ විස්තර පමණක් පවතින අතර දැනට වටිනාකම් හඳුනා ගැනීමේ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව. | වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 3.4 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන දින වන විට සභාව සතු වාහන 26 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. කම්පැක්ටර් රථයක් 2020 වර්ෂයේ සිට අක්‍රීයව පැවති අතර අනෙකුත් වාහන කවදා සිට අක්‍රීයව පවතීද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. | වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණයට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ටයර්වලින් නිෂ්පාදිත වර්ෂය වර්ෂ 02 ක සිට වර්ෂ 06 ක් අතර කාලයක් පැරණි රු.2,077,943 ක් වටිනා ටයර් 34 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට ත් ගබඩාවේ පැවතුණි. තවද 2022 වර්ෂයේ මිලදී ගනු ලැබූ 2008 වර්ෂයේ නිෂ්පාදිත රු.213,150 ක් වටිනා ටයර් 07 ක්ද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ඉතිරිව තිබුණි. | මේ වන විට නිෂ්පාදිත වර්ෂය සැලකිල්ලට ගනිමින් මිලදී ගැනීම් සිදු කරනු ලබන අතර 2023 වර්ෂය අවසානයේ පැවති ටයර් 41 න් මේ වන විට ටයර් 14 ක් නිකුත් කර ඇත. ඇතැම් වාහන අළුත්වැඩියා තත්ත්වයන් මත ගරාජයේ පැවතීම හේතුවෙන් හා ටයර් ඉල්ලීම් කර තිබුණු ද මෙතෙක් අවශ්‍යතාවය මතුවී නොමැති වීම මත ටයර් ගබඩාවෙන් ඉල්ලුම් කර නොමැති බව. | අවශ්‍යතාව මත හා නිෂ්පාදිත වර්ෂය හඳුනා ගැනීම මත ටයර් මිලදී ගැනීම කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පාලනය**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මහරගම අංක 35 ඉඩමේ පොදු වැසිකිළිය ඉදිකිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.** | | |
| (i) | 2020 ජුලි 11 දිනැති අංක 03/2020 දරන පළාත් පාලන හා පරිසර අමාත්‍යංශ ලේකම්ගේ(බස්නාහිර පළාත් )චක්‍රලේඛයේ අංක 03 ප්‍රකාරව රු.මිලියන 02 කට වැඩි ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එයට සාධාරණීකරණ වාර්තාව හා ව්‍යාපෘතිය පිළිබඳ ශක්‍යතා වාර්තාවක්ද ඇතුළත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2022 අප්‍රේල් 22 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකගේ ලිපියෙන් උක්ත ඉඩමෙහි යෝජිත පොදු වැසිකිළිය සංවර්ධනය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිර්දේශ ලබා දී නොතිබිය දී හා අනුමැතියකින් තොරව සිදු කරන ඉදිකිරීම් වහාම නවත්වන ලෙස දන්වා තිබිය දී 2022 ජනවාරි මාසයේ දී කොන්ත්‍රාත්තුව පිරිනමා එහි කාර්යයන්ද ආරම්භ කර තිබුණි. | මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ පුද්ගලිකව සාකච්ඡා කරමින් ඔවුගෙන් වාචිකව උපදෙස් ලබා ගනිමින් සභාපති බලතල පූර්ණ ලෙස යොදවමින් මෙම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීමට ඉමහත් වෙහෙසක් දරන ලද අතර පියවරෙන් පියවර වැඩ නිම කර ජනතා අයිතියට පත් කරන ලද බව. | අදාල නිර්දේශ හා අනුමැතීන් ලබා ගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතුය. |
| (ආ) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.3 (iv) ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාක් කාර්යය උපකොන්ත්‍රාත් නොදෙන බවට අදාළ සමිතිය විසින් වගකීමට බැඳෙන අතර උපකොන්ත්‍රාත්වල යෙදුනහොත් එවැනි සමිති/ සංවිධාන අසාධු ලේඛනගත කළ යුතුය.එහෙත් තලවතුගොඩ වැලි පාර පැති කාණුව පුළුල් කිරීමේ හා ශාන්තිපුර 03 වන පටුමග දෙපස කාණු ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති දෙක ප්‍රජා මණ්ඩලයකට පවරා තිබිය දී උපකොන්ත්‍රාත් ලෙස වෙනත් තැනැත්තෙකුට පවරා තිබූ බව මහජන නියෝජනය අනුව නිරීක්ෂණය වුව ද සභාව ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | පවරනු ලබන කර්මාන්ත ඉටු කිරීම සඳහා වෙනත් පුද්ගලයින්ට කොන්ත්‍රාත් ලබා දෙන බව සනාථ වන්නේ නම් එකී සමිති අසාධු ලේඛනගත කිරීමට කටයුතු කළ හැකි බව. | උපකොන්ත්‍රාත් ලබා දී තිබේ ද යන්න සොයා බලා ඒ අනුව එම සමිති අසාධු ලේඛනගත කළ යුතුය. |